GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2018.04.11

**මාධ්‍ය නිවේදනය**

**ග්ලයිපෝසේට් නැවතත් කරලියට**

නීති විරෝධි ලෙස ග්ලයිෆොසේට් තොගයක් දැනට සති කිහිපයකටපෙර කොළඹ වරායට ලගාවිය. නැවතත් ඒ ආකාරයට ග්ලයිෆොසේට් තොගයක් වරායට ලගා වි ඇති බව අප වෙත වාර්තා වී ඇත.

හඳුනානොගත් වකුගඩු රෝග, පිළිකා ඇතුලු බෝ නොවන රෝග නිසා විශාල වශයෙන් මුලු රටම රෝගීන් බවට පත්වෙමින් පවති. වැඩිහිටියන් පමණක් නොව දරුවන්ද අඩු වයසින් පිලිකා සහ වකුගඩු රෝග වලට ගොදුරු වෙමින් සිටිති.

වස විස ආහාරයට ගැනිම ඊට ප්‍රධාන හේතුවක් වන බව ඔප්පු වී හමාරය. එබැවින් වස විස සම්පුර්ණයෙන් බැහර කල යුතුය.

අප කල සටනේ ප්‍රතිඵලයක් ලෙස රජය දුර දර්ශි තීරණයක් ගෙන ග්ලයිපෝසෙට් ඇතුලු වස විස තහනම් කිරීම අප බෙහෙවින් අගය කලෙමු.

වගා බිම් වලට විශේෂයෙන් තේ වතු වලට ග්ලයිපොසේට් ඇතුලු වස විස එකතු වීම නිසා ජලපෝෂක ප්‍රදේශ වලට වස විස එක්වි ජල සම්පත රසායනික අපද්‍රව්‍ය වලින් අපවිත්‍ර වීම මීට වඩා අවධානයට ලක්විය යුතුය. තේ වල වස විස අඩංගු වුවහොත් අපට ජාත්‍යන්තර වෙළඳ පොල තුල තේ අලෙවි කිරීමටද නොහැකි වනු ඇත. එබැවින් ග්ලයිපොසේට් තහනම දිගටම පවත්වාගත යුතුය.

කෘෂිරසායන හඳුන්වා දීමට පෙර තේ වගා කල ආකාරයට නැවතත් තේ වගා කල යුතුය. නැතහොත් පලිබෝධ මර්ධනය සඳහා විකල්ප ක්‍රියාමාර්ග වෙත අවධානය යොමුකල යුතුය. දැනට පවතින ග්ලයිෆොසේට් තහනම ඉවත් කර ගැනිම සඳහා දුමින්ද දිසානායක හා නවීන් දිසානායක යන ආමාත්‍යවරු බලපෑම් සිදු කරන බවට මාධ්‍ය වාර්තා පල වී ඇත.

මේ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කැබිනට් අනු කමිටුවක්ද පත් කර ඇති බව මාධ්‍ය මගින් වාර්තා විය. එහෙත් එම කමිටුව සිය නිර්දේශ ඉදිරිපත් කලේද නැතිද යන්න මෙතෙක් හෙලි දරව් වී නැත.

කෙසේ වෙතත් නීති විරෝධි ආකාරයෙන් ග්ලයිෆොසේට් දිවයිනට ගෙන්වන පුද්ගලයින්ට එරෙහිව තරාතිරම නොබලා දඩුවම් ලබා දිය යුතුය. ග්ලයිෆොසේට් තහනම දිගටම  පවත්වා ගත යුතු බවට අවධාරණය කිරීමට අප සංගමය අතිගරු ජනාධිපතිතුමා හමුවීමටද බලාපොරොත්තු වේ.

ස්තුතියි.

වෛද්‍ය හරිත අලුත්ගේ,
ලේකම්.

වැඩිදුර විස්තර:
වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ - 0716812160
වෛද්‍ය සමන්ත ආනන්ද - 0777666301
වෛද්‍ය ටි ගාන්දිපන් - 0777755035
වෛද්‍ය රුවන් ජයසුරිය - 0773000196
වෛද්‍ය ධනුෂ්ක දේවප්‍රිය - 0773321398
වෛද්‍ය නිෂාන්ත සුගුණපාල - 0773560364